හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව අගෝස්තු 19 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාළ රු.6,456,080ක මුද්දර ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි.

(ආ). වර්ෂයේ මුළු වරිපනම් හා බදු මුදල් ලැබීම් රු.1,586,226ක් වුවත් එය රු.1,599,917ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් දායක මුදල් වටිනාකම රු.106,106ක් වුවත් එය ආදායම් හා වියදම් ගිණුමේ රු.237,526ක් ලෙස රු.131,420ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති වටිනාකම රු.775,000ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් රු.190,917ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඊ). 2015 වර්ෂයේදී ස්ථිර සේවකයින්ට ගෙවා තිබූ රු.2,797,971ක ප්‍රතිපූර්ණය නොකළ වැටුප් ණයගැතියන් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(උ). 2015 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් වාර්තාව අනුව රු.16,000ක වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ). වසර 02කට අධික කාලයක සිට බැංකු සැසඳුමේ සඳහන් මුදල් පොතේ සටහන් නොවූ ලැබීම් රු.294,666ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
----------------------------

ගිණුම් විෂයයන් 04කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.96,452,159 ක් හා උපයෝගී ලේඛන, වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.65,827,442ක් වූයෙන් රු.30,624,717ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.
---------------------------------------------

(i) ලැබිය යුතු ගිණුම්
--------------------

2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.49,626,114ක් වූ අතර, ඒ තුළ වසරක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.38,346,569ක් විය. මෙම මුදල් මධ්‍යම රජයෙන් ලැබිය යුතු මුදල් ප්‍රතිපාදන වන අතර ඒවා ලැබෙන බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ගෙවිය යුතු ගිණුම්
---------------------

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.34,570,651ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.23,166,649ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.
----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති රු.49,668,615ක් වටිනාකමැති ගිණුම් විෂයයන් 02ක් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවිය.

1.3.5 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.
----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂාකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.912,509ක් වටිනා කල්ඉකුත් වූ තැන්පතු 102 ක් සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ.) | රජය ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදය | විශ්‍රාම ගිය/ මියගිය/ සේවය අතහැර ගිය/ ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ රු.174,512ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,872,765ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.144,613ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,728,152ක වර්ධනයක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.
-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ආදායම් විෂයයන් 05ක වැඩිවීම හා වියදම් විෂයයන් 05ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් පරීක්ෂා කිරීමේ දි, ජංගම අනුපාතය 1.43:1 ක් වූ අතර එය ප්‍රශස්ථ මට්ටමට වඩා අඩුවෙන් පවතින බව නිරීක්ෂණය විය. ජංගම වත්කම්වලින් සියයට 74 ක්ම හිඟහිටි කර්මාන්ත ආධාර වූ අතර ජංගම වගකීම්වලින් සියයට 76ක් කර්මාන්ත ණයහිමියන්ගෙන් සමන්විත විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | වර්ෂයේ ලැබීම් 2015 වර්ෂයේ බිල්කිරීම් | 2014 වර්ෂයේ හිඟයෙන් | 2015 වර්ෂයේ බිල්කිරීම් වලින් | 2015.12.31 දිනට ශේෂ හිඟයෙන් | බිල්කිරීමෙන් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 2,160,712 | 1,983,687 | 733,615 | 852,611 | 1,472,097 | 1,131,076 | 2,603,173 |
| කුලී | 1,529,124 | 2,373,687 | 83,470 | 1,668,838 | 1,445,654 | 1,209,722 | 2,655,376 |
| ජල ගාස්තු | 948,741 | 3,215,515 | 280,750 | 2,789,845 | 667,991 | 425,670 | 1,093,661 |

2.4.2 වරිපනම් බදු

වර්ෂය ආරම්භයේ හිඟහිටි මුදලින් සියයට 33ක් හා වර්ෂයේ බිල්කිරීම්වලින් සියයට 42ක් වරිපනම් බදු අයකරගෙන තිබූ අතර ආරම්භක හිඟයෙන් 1,427,097ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.2,603,173ක හිඟ මුදල අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4.3 බදු කුලී.

සභාව සතු කඩකාමර බදුදීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,655,376ක ආදායමක් අයවිය යුතුව තිබූ අතර විධිමත් ගිවිසුම් නොතිබීම හේතුවෙන් මුදල් අයකර ගැනීම පිළිබඳව ගැටළු ඇතිවී තිබුණි.

2.4.4 වෙළඳ බලපත්‍ර ගාස්තු.

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා මූල්‍ය පරිපාලන) රීති 59-61 ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී විධිමත් සමීක්ෂණයක් මඟින් සියළු ව්‍යාපාරිකයින්ගේ නම් බලපත්‍ර ලේඛනයට ඇතුළත් කර තිබුණද, 2015 වර්ෂය සඳහා ව්‍යාපාර 74ක් වෙනුවෙන් රු.51,300ක බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.4.5 වෙනත් ආදායම්

(අ) අක්කර බදු

2015 වර්ෂය ආරම්භයේ හිඟ අක්කර බදු රු.96,148ක් සහ 2015 වර්ෂයේ බිලිකිරීම්වලින් රු.20,727ක හිඟයක් ඇතුළුව රු.116,875ක හිඟ අක්කර බදු අයවිය යුතුව පැවතුණි.

(ආ) රථවාහන නවතා තැබීමේ ගාස්තු

---------------------------------

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඇතත්, සභාව විසින් විවිධ කුලී රථ සඳහා රථගාල් නඩත්තු කර ඒ සඳහා ස්ථාන සළකුණු කර විධිමත්ව, බදු මුදලක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.183,372ක් හා මුද්දර ගාස්තු රු.6,456,080ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාවේ ජල ව්‍යාපෘතියේ පුනරාවර්තන ආදායම රු.3,081,932ක් වූ අතර වියදම රු.3,394,948ක් වූයෙන් රු.313,016ක ඌනතාවයක් ඇතිවී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

2008 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන රු.25,575ක හඳුනා නොගත් වෙනස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

3.3 පාරිසරික ගැටළු

------------------

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය යටතේ 2008 ජනවාරි 25 දිනැති පාරිසරික ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 04ක් සඳහා නිකුත් කළ බලපත්‍ර සඳහා කල් ඉකුත් ව තිබු නමුත්, එම බලපත්‍ර අළුත්කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

----------------------------------------

4.1 සංයුක්ත සැළැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය ද ඇතුළත් වන පරිදි සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 08ක සියයට 18 සිට සියයට 260 දක්වාද වියදම් විෂයයන් 11ක සියයට 17 සිට සියයට 160 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 193 අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන, පරිපූරක සමඟ සසඳා බලා එක් එක් අය/වැය විෂයයන්ගේ අතිරික්තතා/ ඌණතා පිළිබඳ කරුණු පැහැදිලිකිරීමේ ප්‍රකාශයන් පිළියෙලකර ඉදිරිපත්කර නොතිබුණි.

4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.81,135,522ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් භාවිත කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය
-----------------------
ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය
----------------------------
නිෂ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්
-------------------------------------
(අ) ප්‍රාදේශීය සභාව සතු CPGM – 2240 දරන ජල බවුසරය 2015 වර්ෂය ආරම්භයේ සිට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන සහා භූමියේ ගාල්කර තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය
-------------------------------
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ආදායම් පරිපාලනය.

(ආ). වත්කම් කළමනාකරණය.

(ඇ). ණයගැති හා ණයහිමි පාලනය